# යුරෝපා සංගමය මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලය

ශ්‍රී ලංකා ජනාධිපති මැතිවරණය 2024

පහත දක්වා ඇති ඒවා ඇතුලත් වන මැතිවරණ ක්‍රියාවලියේ සියලු පැතිකඩ සහ අදියරයන් දූත මණ්ඩලය විසින් තක්සේරු කරනු ඇත;

- නෛතික රාමුව සහ එහි ක්‍රියාකාරීත්වය
- මැතිවරණ පරිපාලනයේ කාර්යසාධනය
- රාජ්‍ය ආයතනවල භූමිකාව
- ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම
- මැතිවරණ ව්‍යාපාර ක්‍රියාකාරකම් හා මැතිවරණයට මුදල් සැපයීම
- නන් වැදෑරුම් මූලික නිදහස, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ඇතුලුව සමස්ත මැතිවරණ පරිසරය
- කාන්තාවන්ගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ සහභාගීත්වය
- මාගර්ගත තොරතුරු මූලාශ්‍ර සහ සමාජ මාධ්‍ය ඇතුලු මාධ්‍යයේ භූමිකාව
- සිවිල් සමාජයේ භූමිකාව
- ඡන්දය ප්‍රකාශ කිරීම, ගණන් කිරීම සහ වගුගත කිරීම
- පැමිණිලි සහ අභියාචනා ක්‍රියාවලිය
- ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම

## කාර්යභාරය

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලයේ කාර්යභාරය ශ්‍රී ලංකාවේ ජාතික නීති රාමුවට සමගාමීව මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති ජාත්‍යාන්තර හා කලාපීය ප්‍රමිති සහ බැඳීම් අනුව යමින් 2024 වසරේදී පැවැත්වීමට නියමිත ජනාධිපති මැතිවරණය නිරීක්ෂණය කිරීමයි.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රමවේදයට අනුගතව කටයුතු කරනු ලබන නිරීක්ෂකයින් මැතිවරණ ක්‍රියාවලියට මැදිහත් නොවේ. ස්වකීය අපක්ෂපාතීත්වය සහ මැදහත්බව සහතික කරන්නාවූ දැඩි චර්යා ධර්ම පද්ධතියක් සහ සදාචාරාත්මක මාර්ගෝපදේශ සංග්‍රහයක් අනුගමනය කිරීමට යුරෝපා සංගමයේ සියලු මැතිවරණ නිරීක්ෂකයින් බැඳී සිටී.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් සම්මත කරන ලද සහ ලොව පුරා මැතිවරණ නිරීක්ෂණ කටයුතු වල නියැලෙන ජාත්‍යාන්තර සංවිධාන 50 කට අධික සංඛ්‍යාවක් විසින් මේ වනවිට අත්සන් තබා ඇති ` ජාත්‍යාන්තර මැතිවරණ නිරීක්ෂණය සඳහා වූ මූලධර්ම ප්‍රකාශය' (Declaration of Principles for International Election Observation) යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩල සඳහා අවශ්‍ය නිර්නායකයන් සපයයි.

මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලයේ සොයාගැනීම් ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ යුරෝපා සංගමයේ දූත මණ්ඩලයෙන්, යුරෝපා සංගමයේ සාමාජික රටවලින් සහ යුරෝපා සංගමයේ ආයතන වෙතින් ස්වාධීන වේ.

## අරමුණු

සැප්තැම්බර් මස 21 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපති මැතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනය මත යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාව වෙත දූත මණ්ඩලයක් සහභාගි කරවා ඇත.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලයේ (EU EOM) ප්‍රධාන අරමුණු පහත පරිදි වේ:

- ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සහාය වීම
- මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීමට
- මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම ශක්තිමත් කිරීමට.



## ප්‍රධාන නිරීක්ෂකයා

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලයේ ප්‍රධානත්වය දරනු ලබන්නේ ප්‍රධාන නිරීක්ෂක, ස්පාඤ්ඤයෙන් යුරෝපා පාර්ලිමේන්තුවට තේරීපත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී Nacho Sánchez Amor විසිනි.

## නිරීක්ෂකයින්

අගෝස්තු මස 14 වන දින ශ්‍රී ලංකාවට පැමිණි මැතිවරණ විශේෂඥයින් 10 දෙනෙකුගෙන් මෙහි ප්‍රධාන කණ්ඩායම සමන්විත වන අතර රට පුරා මැතිවරණ ක්‍රියාවලිය සිදුවන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා වන නිරීක්ෂකයින් 26 දෙනෙකුගෙන් සමන්විත දිගු කාලීන කණ්ඩායම අගෝස්තු 29 වන දින සිට සිය වැඩකටයුතු ආරම්භ කර ඇත.
ඉන් අනතුරුව, මැතිවරණ දිනය වන විට දූත මණ්ඩලය සමග එක් වන, සාමාජිකයින් 32 ගෙන් යුත් කෙටි කාලීන නිරීක්ෂකයින් විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ වැඩ කටයුතු ආරම්භ කිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම, ඡන්ද ගනන් කිරීම සහ ප්‍රතිඵල වගුගත කිරීම නිරීක්ෂණය කරනු ඇත.
ඊට අමතරව යුරෝපා සංගමයේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව මෙන්ම හවුල් රටවලින් පත් කරන ලද කෙටි කාලීන නිරීක්ෂකයින් මැතිවරණ දිනයේදී දූත මණ්ඩලයේ කාර්යභාරයට සිය සහාය එක් කරනු ඇති අතර මැතිවරණ ක්‍රියාවලිය අවසන් වන තුරුම යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලය ශ්‍රී ලංකාව තුල රැඳී සිටිනු ඇත.

## මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩලයේ වාර්තා

මැතිවරණ නිරීක්ෂණය සම්බන්ධයෙන් යුරෝපා සංගමය තුල ස්ථාපිත ක්‍රමවේදය අනුව යමින් සමස්ත මැතිවරණ ක්‍රියාවලිය පිලිබඳව කරුණු මත පදනම්වූ, අංග සම්පූර්ණ මෙන්ම අපක්ෂපාතී විශ්ලේෂණයක් උක්ත දූත මණ්ඩලය විසින් සපයනු ඇත.

දූත මණ්ඩලය විසින් මූලික ප්‍රකාශයක් නිකුත් කරනු ලබන අතර මැතිවරණය අවසන්ව දින දෙකකින් පසු කොළඹදී පුවත්පත් සාකච්ඡාවක් පවත්වනු ලැබේ.

සමස්ත මැතිවරණ ක්‍රියාවලිය අවසන් වීමෙන් අනතුරුව ඉදිරි මැතිවරණ ක්‍රියාවලි සඳහා අවශ්‍ය කරනු ලබන නිර්දේශ සමූහයක් ඇතුලත් අවසන් වාර්තාව පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කොට ඔවුන් සමග බෙදාහදා ගනු ඇත.

---

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සමග සමීපව කටයුතු කිරීමෙහිලා දීර්ස ඉතිහාසයක් ඇති යුරෝපා සංගමය මින් පෙර අවස්ථා සයකදී මැතිවරණ නිරීක්ෂණ දූත මණ්ඩල සහභාගි කරවා ඇති අතර අවසන් වරට එලෙස දූත මණ්ඩලයක් සහභාගි කරවන ලද්දේ 2019 වසරේදීය. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය සහ මෙරට සමග පවතින හවුල්කාරීත්වය වෙනුවෙන් යුරෝපා සංගමය සතු කැපවීම මෙම ව්‍යායාමයෙන් විද්‍යමානවේ.

**වැඩි විස්තර සඳහා**

**Website: http://srilanka2024.eueom.eu/**
**(X) Twitter: @eueomsrilanka24**
**Facebook: @eueomsrilanka2024**

**ස්කෑන් කරන්න**